**දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල - 2014**

දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1992 අංක 09 දරන දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදල් පනතේ 9(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපනය කිරීමේ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ප්‍රකාරව සකස් කිරීමේ පදනම යටතේ දක්වා ඇති ආකෘතිය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පෙර වර්ෂයට අදාළ රු.20,500 ක ශිෂ්‍යාධාර ගෙවීම්වලට අදාල බැංකුව විසින් හරවා එවූ චෙක්පත්, ගෙවන ලද ශිෂ්‍යාධාර ගිණුමෙන් අඩුකර ගෙවිය යුතු ලෙස දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල මගින් ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය වෙත සමාලෝචිත වර්ෂය තුලදී ගෙවන ලද එකතුව රු.293,959 ක මුදල ලැබු බවට ලදුපත් ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කර ඇති මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 285,389 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 27,189 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.312,578 කින් පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම රු.21,057 කින් වැඩිවුවද, ආයතනයේ වියදම් රු. 317,999 කින් වැඩිවීම සහ දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානයේ අලාභය රු.15,635 කින් වැඩිවීම මේ සඳහා හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලෙහි පරමාර්ථ වලට අනුකූල නොවන කටාන නයනාලෝක ග්‍රාමයේ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා කටාන ප්‍රාදේශීය ලේකම් වෙත රු.500,000 ක් ලබා දී විවිධ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර 2015 අප්‍රේල් 25 දින වන විට එයින් රු. 28,500 ක් පමණක් වියදම් කර තිබුණි.

(ආ) 1992 අංක 9 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදලේ ප්‍රධාන අරමුණු අතර වූ පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට විධිවිධාන සලසා නොතිබුණි.

(i) දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම හා අවශ්‍ය අවස්ථාවන්හිදි ඔවුන්ට ස්වයං රැකියා සඳහා මූල්‍යාධාර සහ මාර්ගෝපදේශ සැපයීම.

(ii) ස්වයං රැකියා පහසුකම් ඇති කිරීම.

(iii) දෘශ්‍යාබාධිත පුද්ගලයින්ගේ සුභසාධනය පිණිස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(v) සමාන අයිතිවාසිකම් හා සමාන අවස්ථා ලබා ගැනීමට දෘශ්‍යාබාධිත තැනැත්තන් වළක්වාලන තත්ත්වයන් ඉවත් කිරීමට ක්‍රියාත්මක කිරීම.

(ඇ) 2014 ක්‍රියාකාරී සැලැස්ම අනුව අධ්‍යාපන හා සංස්කෘතික ආධාර ලෙස ළමයින් 250 කට රු.1,500,000 ක් වෙන්කර තිබුණු අතර සත්‍ය වශයෙන් ළමයින් 199 සඳහා රු.1,380,324 ක මුදලක් ගෙවා තිබුණි. 2014 දෙසැම්බර් 18 දින ඉදිරිපත් කළ සංශෝධිත ඇස්තමේන්තුව මඟින් මෙම මුදල රු.110,060 කින් අඩුකර රු.1,390,000 ක් වියදම් දරා තිබුණ අතර ආධාර ලාභී ශිෂ්‍ය සංඛ්‍යාව 51 කින් අඩු වී තිබුණි.

(ඈ) අක්ෂි කාච 225 ක් ලබා දීමට හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා රු.1,190,000 ක මුදලක් වෙන් කර තිබුණද 2014 ප්‍රගති වාර්තා අනුව අක්ෂි කාච 123 ක් හා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා එක් පුද්ගලයෙකුට මුදලින් රු. 20,000 ක් ලබා දීම වෙනුවෙන් රු.1,272,973 ක් දරා තිබුණි. ඒ අනුව අක්ෂිකාචලාභීන්ගේ සංඛ්‍යාව 102 කින් අඩු වී තිබූ අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදලද ඉක්මවා වැයකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෘශ්‍යාබාධිත කාන්තා සුභ සාධන මධ්‍යස්ථානයේ 08 දෙනෙකු පුහුණු කිරීම සඳහා රු.239,500 ක මුදලක් ඇස්තමේන්තු කර තිබුණද, සත්‍ය වශයෙන් 04 දෙනෙකු පුහුණු කර රු.233,929 ක් වැය කර තිබුණු බැවින් භෞතික ප්‍රගතිය සියයට 50 ද මූල්‍ය ප්‍රගතිය සියයට 98 ක් ද වූ අතර අපේක්ෂිත පුහුණුලාභීන් සංඛ්‍යාව පුහුණු කර නොතිබුණි.

(ඊ) උසස් පෙළ සිසුන් සඳහා මාසික ශිෂ්‍යාධාර ගෙවීමේදි ශිෂ්‍යයින් 07 දෙනෙකු සඳහා ශිෂ්‍යාධාර මුදල් මාස 01 සිට මාස 09 දක්වා කාල පරාසයන් තුළ ප්‍රමාද වී ගෙවා තිබුණු අතර රු.1,000 ක් වූ මාසික ශිෂ්‍යාධාර ලබා ගන්නා ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් 14 දෙනෙකුට ශිෂ්‍යාධාර ගෙවීම් මාස 03 සිට මාස 12 දක්වා ප්‍රමාද වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

2014 දෙසැම්බර් 18 දින සංශෝධිත ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයේ ආදායම් හා වියදම් සහ තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට19 සිට සියයට 95 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 18 දින අනුමත කළ සංශෝධිත ඇස්තමේන්තුවේ පහත සඳහන් වියදම් සඳහා මුල් ඇස්තමේන්තුවෙන් වෙන් කළ මුදලින් සියයට 7 සිට සියයට 20 දක්වා සංශෝධනය කර තිබුණු නමුත් එයට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොවූ අතර මුල් ඇස්තමේන්තුව මුදල් වර්ෂය අවසන් වීමට දින 13 ක් තිබියදී එනම් 2014 දෙසැම්බර් 18

දින සංශෝධනය කර තිබුණු බැවින් ඇස්තමේන්තු සැකසීමෙන් බලාපොරොත්තු වූ පරමාර්ථ ඉටු නොවන බව නිරීක්ෂණය කෙරේ.

| වියදම් විස්තරය | ඇස්තමේන්තුගත මුදල | සංශෝධිත ඇස්තමේන්තුව | වියදම් අඩු වීම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| (i) වෘත්තිය පුහුණු කිරීම් | 200,000 | 160,500 | 39,500 | 20 |
| (ii) අධ්‍යාපන,සංස්කෘතික ආධාර | 1,500,000 | 1,390,000 | 110,000 | 7 |
| (iii) පුනරුත්ථාපන ආධාර | 1,300,000 | 1,050,000 | 250,000 | 19 |

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ශිෂ්‍යාධාර ගෙවීම්
(ආ) දෘශ්‍යාබාධිතයින් පුනරුත්ථාපන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඇ) පුනරුත්ථාපන ආධාර ගෙවීම්
(ඈ) ගිණුම්කරණය